මෑත කාලයේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ඉතා ලැජ්ජාවට පත් සිද්ධිය වූයේ කොළඹ ලැගුම්හල්වලින් දෙමළ ජනයා ඉවත් කර වව්නියාවට රැගෙන ගොස් යළිත් කොළඹට ගෙන ඒමේ සිද්ධියයි. එම සිද්ධිය දේශපාලන වශයෙන් කෙතරම් අනුවණ තීන්දුවක්ද යන්න ආණ්ඩුවට දින කීපයක් ගතවී හෝ අවබෝධවීම, ප්‍රදර්ශනය වූයේ අගමැතිවරයා කණගාටුව පල කර වගකීම බාර ගැනීමෙනි. ආණ්ඩුව බොහෝ තැන්වල වරද්දා ගත්තත් එමගින් එජාපයට දේශපාලන වාසි ගැනීමට ඉඩ නොදී තිරය පිටුපස සිට ආණ්ඩුවට දෙවන පෙළ ආරක්ෂාව සැපයූ ජවිපෙ ද මෙම සිද්ධිය දැඩි ලෙස විවේචනය කළේය. ආණ්ඩුව තුළ සිටින කඳුරට ජනතා පෙරමුණ හාර වෙනත් කිසිදු පක්ෂයක් අවවාදයක් හෝ දීමට ඉදිරිපත් වූයේ නැත. අසාධාරණයට ලක්වූ දෙමළ ජනයා වෙනුවෙන් වචනයක් තබා ඇලපිල්ලක්වත් ප්‍රකාශ නොකිරීමෙන් හෙළ උරුමයේ දේශපාලනය යළිත් තහවුරු විය.

මෙම සිද්ධියෙන් ආණ්ඩුව විශේෂයෙන් රට ගිල ගැනීමට මාන බලන ඊනියා ජාත්‍යන්තර ප්‍රජාවට අවි තොගයක්ම සොයා දී තිබේ. වර්තමානයේදී එජාපය ක්‍රියා කරමින් සිටින්නේ ලොකු කුඩා කුමන හෝ වරදක් අල්ලා ගෙන ආණ්ඩුවට විශේෂයෙන් ජනාධිපතිවරයාට සහ ආරක්ෂක ලේකම්වරයාට පහර දීමේ ප්‍රතිපත්තියක සිටය. ඒ වෙනුවෙන් ඕනෑම දෙයක් පාවිච්චි කිරීමේ අවස්ථාවදී තත්ත්වයට ද එජාපය පත්වී සිටී. පුද්ගල චරිත පවා ඝාතනය කරමින් ඇතැම් විට යුද රහස් පවා හෙළි කිරීමේ වෑයමක ඔවුන් නිරතව සිටී. එජාපය කිසිඳු හිරිකිතයකින් තොරව, මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා බලයට පත් කිරීමට දැඩි වෙහෙසක් දැරූ ශ්‍රීපති සූරියආරච්චි වැන්නන් පවා මේ වෙනුවෙන් යොදා ගන්නා බව පැහැදිලිය. ශ්‍රීපති සූරියආරච්චි වැන්නන්ද කිසිඳු හිරිකිතයකින් තොරව එජාපයේ අවසාන වශයෙන් ඊනියා ජාත්‍යන්තර ප්‍රජාවේ අවශ්‍යතා ඉටු කරමින් සිටී.

දැන් ආණ්ඩුවට සිදුව ඇත්තේ ''අනේ අපි ඔය කියන තරම් නරක නෑ. වෙලා තියෙන නරක හොයන්න මෙන්නමේ පියවර අරන් තියෙනවා'' කියා ඇමෙරිකාවට, බ්‍රිතාන්‍යයට පණිවුඩ යවන්නටය. බ්‍රිතාන්‍යයෙන් එවන රාජ්‍ය ඇමැතිවරුන්ට පවා කරුණු පැහැදිලි කිරීමට ජනාධිපතිවරයාට සිදුව තිබේ.






# ඉතිහාස ගත වීම සහ කුණුබක්කි ගත වීම

නිමල් බුලත්සිංහල

*නිවැරදිවීමට අවශ්‍යතාවක් නැත්නම් ආණ්ඩුවට අයාලේ යා හැක. එහෙත් එයද ලණුව දිග ඇති තෙක් පමණි. මේ නිසා රට බේරාගෙන ඉතිහාස ගතවනවාද, තමන්ව බේරාගෙන කුණුබක්කි ගතවනවාද කියා ජනාධිපතිවරයා තීරණය කළ යුතුය.*

ආණ්ඩුව අභිමුව ඇති අභියෝග සුළු පටු නොවේ. එල්.ටී.ටී.ඊ. ය යුධමය වශයෙන් පරාජය කළ යුතුව ඇතත්, අනෙක් පැත්තෙන් කොටි ත්‍රස්තවාදයට පැවැත්මක් උදා කර දී ඇති - දේශපාලන මතවාදී පදනම - පරාජය කළ යුතුව ඇත. එහි පෙරමුණු බලඇණි ලෙස ක්‍රියා කරන දේශපාලන පක්ෂ, රාජ්‍ය නොවන සංවිධානවලට මුහුණ දිය හැකි විශේෂ යාන්ත්‍රණයක් ආණ්ඩුවට තිබිය යුතුය.

එහෙත් එවැන්නක් ආණ්ඩුවට ඇති බවක් නොපෙනේ. ශක්තිමත් ප්‍රචාරණ යාන්ත්‍රණයක් තවමත් ඔවුන් සතුව නොමැත. එදා වේල සොයා ගැනීම සඳහා ආණ්ඩුවට කඩේයාම හැර පත්කර ඇති ප්‍රචාරකයන් - රට පෙරට තබා - කටයුතු කරන සෙයක් නොපෙනේ.

නිවැරදිවීමට අවශ්‍යතාවක් තිබේ නම්, ආණ්ඩුව පළමුව කළ යුත්තේ සැබෑ මිතුරා, සතුරා හඳුනා ගැනීමයි. මේ ආණ්ඩුව වටා නිලමැස්සන් සේ  වසා සිටින්නේ මිතුරන්ට වඩා මිතුරු වෙසින් සිටින සතුරන්ය. එවැන්නක් ලද සැනින් සිය නියම වේෂයෙන් පෙනී සිටී. විශේෂයෙන් අන්තර් ජාතික වශයෙන් ශ්‍රී ලංකාවට එරෙහිව ශ්‍රී ලංකා ආණ්ඩුවට එරෙහිව දියත් වී තිබෙන දැවැන්ත සතුරු ප්‍රහාරයට ප්‍රතිප්‍රහාරදීම සඳහා වගකීම පවරා ඇති බලඇණිය වහා ප්‍රතිසංවිධානය කළ යුතුය. ඒ අතරම රට තුළ ඇති ඊට අදාළ රෙජිමේන්තුවද වෙනස් කළ යුතුය. දැලි පිහියෙන් කිරි කනවා නම්, දෙවරක් නොව තුන් හතර වතාවක් සිතා තීරණයක් ගැනීමේ ප්‍රතිපත්තියකට ආණ්ඩුව මාරු විය යුතුය. ඒ සඳහා උපදෙස් ගත යුත්තේ සැබෑ මිතුරන්ගෙනි.

එහෙත් නිවැරදිවීමට අවශ්‍යතාවක් නැත්නම් ආණ්ඩුවට අයාලේ යා හැක. එහෙත් එයද ලණුව දිග ඇති තෙක් පමණි. මේ නිසා රට බේරාගෙන ඉතිහාස ගතවනවාද, තමන්ව බේරාගෙන කුණුබක්කි ගතවනවාද කියා ජනාධිපතිවරයා තීරණය කළ යුතුය.




## මාස්ටර් සර්



*ශ්‍රී ලංකාවේ උද්ධමණය ඉන්දියාව පකිස්තානය ඇතුලු කලාපයේ අනෙකුත් රටවල් වලට වඩා තුන් ගුණයකින් වැඩිලු*

*ඒකනෙ කියන්නෙ*
*අපි කවදත් අනිත් අයට වඩා ඉදිරියෙන් ඉන්න ජාතියක්නෙ*

